**මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - 2019**

**------------------------------------------------------------------**

මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්-පී 99 දරන ණය ගිවිසුමේ **IV** ව්‍යවස්ථාවේ 4(6) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජලසම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහනුවර නගරයේ අපජලය රැස් කිරීම, පිරිපහදු කිරීම හා බැහැර කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් ගොඩනැංවීම මඟින් ජනාකීර්ණ ප්‍රදේශ වල සනීපාරක්ෂක පහසුකම් යළි නගා සිටුවීම, මහවැලි ගඟේ ජලයේ ගුණත්වය හා ජීවන පරිසරය උසස් කිරීම හා ඒ අනුව ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය, සෞඛ්‍ය හා සුබ සාධනය ඉහල නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,982 කට සමාන ජපන් යෙන් මිලියන 17,278 ක් වන අතර, ඉන් රු.මිලියන 17,922 කට සමාන ජපන් යෙන් මිලියන 14,087 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟ වී තිබුණ අතර ඉතිරි මුදල වූ රු.මිලියන 4,060 කට සමාන ජපන් යෙන් මිලියන 3,191 ක් ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 පෙබරවාරි 03 දින ආරම්භ කර තිබුණු අතර 2017 සැප්තැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලය 2022 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 02 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතියේ ඇවර කිරීමට අදහස්

කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය සියළු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) ජාතික ජල ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කෙරී ගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 11,945 ක් විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව කෙරීගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 12,804 ක් විය. හඳුනා ගන්නා ලද වෙනස වූ රු.මිලියන 859 සඳහා ව්‍යාපෘතිය විසින් සැසඳුම් ප්‍රකාශ සකස් කර තිබුණ ද, එම වෙනස නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල කෙරී ගෙන යන වැඩ වටිනාකම අධි ප්‍රමාණය වේ. | ව්‍යාපෘතිය විසින් වැරදි නිවැරදි කිරීමේ ජ'නල සටහන් සකස් කර අදාල ගැලපීම කිරීමට මණ්ඩලයට ලබා දී ඇත. මෙයට අමතරව, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙවිය යුතු බිල්පත් වටිනාකම ගෙන ඇති අතර 2020 වර්ෂයේ එම බිල්පත් උපයෝජනය වූ පසු මණ්ඩලයේ ගිණුම් වලට ගෙන ඇත. 2020 වර්ෂයේ මණ්ඩලයේ ගිණුම් සමඟ එය සැසඳිය හැක. | නියමිත වේලාවට වෙනස නිවැරදි කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 16.44 ක පිරිවැයකට මිලදී ගන්නා ලද මෝටර් රථ, මූල්‍ය ප්‍රකාශනවල වාහන ලෙස වෙන්ව දක්වනවා වෙනුවට සිවිල් වැඩ යටතේ දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සිවිල් වැඩ වටිනාකම අධි ප්‍රමාණය වන අතර වාහන පිරිවැය අව ප්‍රමාණය වේ. | ගෙවීම් කරන විට වාහන කෙරී ගෙන යන වැඩ වටිනාකම් ගිණුමට හර කළ අතර එය කෙරී ගෙන යන වැඩ වටිනාකමින් ඉවත් කිරීම සඳහා ජ'නල සටහන් සකස් කර මණ්ඩලයට භාර දෙන ලදී.මේ වන විට එය වත්කම් ලේඛනයට ඇතුලත් කර ඇති අතර ස්ථාවර වත්කම් ගිණුමට ඇතුලත් කළ යුතුය. | වත්කමේ ඵලදායි ජීව කාලයේ වෙනස්කම් පදනම් කොට ජංගම නොවන වත්කම් හඳුනා ගත යුතුය. |

**2.2 ණය ගිවිසුමට අනුකූල නොවීම්**

| ණය ගිවිසුමේ යොමුව | විගණන නිරීක්ෂණ | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| අංක එස්.එල්.පී 99 දරන ණය ගිවිසුමේ උපලේඛණ 02 | ව්‍යාපෘතිය විසින් දරන ලද හෝටල් ගාස්තු, ආහාර වියදම් යනාදී එකතුව රු.මිලියන 9.64 කට සමාන ජපන් යෙන් මිලියන | ණය ගිවිසුමේ කොන්දෙසි උල්ලංඝනය කිරීම ව්‍යාපෘති කාර්යය සාධනය කෙරෙහි | ඩී.ඒ.බී සමාජිකයින්ට ගෙවීම උප කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කළ අතර එය උප වගන්ති 20.2ට අනුකූල වේ. තවද, ආරවුල් විසඳුම් ගිවිසුමේ 6 (ආ) ව්‍යාවස්ථාවේ සමාන්‍ය කොන්න්දේසි යටතේ ඩී.ඒ.බී සමාජිකයන්ට | ණය ගිවිසුමේ කොන්දේසිවලට අනුකූල විය යුතුය. |

| | | |
|---|---|---|
| 5.74 ක් වූ දේශීය වියදම්, අප ජල පිරිපහදු පිරියත, ප්‍රධාන පොම්පාගාර මධ්‍යස්ථානය, අපද්‍රව්‍ය පිරිපහදු අපහරණ පද්ධතිය, මඩිති වියළීමේ තටාංග සැලසුම් කිරීම හා ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව යටතේ ප්‍රතිපූර්ණය කර තිබුණි. | අහිතකර ලෙස බලපායි. | සාධාරණ ගාස්තු (ලේකම්ගේ රාජකාරී කටයුතු සම්බන්ධ සේවා, දූරකථන, කුරියර් ටෙලෙක්ස් ගමන් වියදම් සහ උපකාරක සේවා) ගෙවිය හැක. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘතියේ කාර්යන්වල භෞතික ප්‍රගතිය**

| | කාර්යය | 2019 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය – අපේක්ෂිත කාර්යසාධන | 2019 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය – සත්‍ය කාර්යසාධන | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) නිර්මාණ හා සැලසුම් කිරීම් | | | | ඉදිකිරීම් ප්‍රමාදය ව්‍යාපෘති අරමුණ කෙරෙහි අවාසිදායක ලෙස බලපෑ හැක. | කළමනාකරණයේ අදහස් ලැබී නොමැත. | නියමිත කාල පරාසය තුළ කොන්ත්‍රාත් කාර්යය කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| - ප්‍රධාන අපවහන ජාලය (Trunk sewer net work) | කාණු සහිත (Open Cut) | කි.මී.6.23 | කි.මී.3.40 | | | |
| | කාණු රහිත (Trenchless) | කි.මී.2.87 | කි.මී.1.85 | | | |
| - ශාඛා අපවහන ජාලය (Branch sewer network) | කාණු සහිත (Open Cut) | කි.මී.71.1 | කි.මී.57.38 | | | |
| | කාණු රහිත (Trenchless) | කි.මී.5.7 | කි.මී 82 | | | |
| - ගෘහස්ථ අපවහන ජලය (Property Sewer net work) | කාණු සහිත | කි.මී.135 | කි.මී.93 | | | |
| | කාණු රහිත | කි.මී.11.24 | කි.මී 99 | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| - ප්‍රධාන නලය (Force main) | කාණු සහිත (Open Cut)<br>කාණු රහිත (Trenchless) | කි.මී.3.18<br>මීටර 173 | කි.මී.1.90<br>මීටර 17 | | | |
| | - මනු බිල් පොම්ප මධ්‍යස්ථානය (Manhole pump station) | 9 | 5 | | | |
| (ආ) ගෘහස්ථ සම්බන්ධතා ඉදි කිරීම් | | 5,449 | 1,680 | මහනුවර ප්‍රදේශයේ ජීවත්වන ජනතාව වෙත වඩා හොඳ සනීපාරක්ෂක පහසුකම් ලබාදීම ප්‍රමාද වේ. | කළමනාකර ණයේ අදහස් ලැබී නොමැත. | නියමිත කාලය තුළ කාර්යය කඩිනම් කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | බලපෑම් | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| ------------------- | ------- | ------------------ | ------------------- |
| (අ) ප්‍රධාන අපවහන ජාලය, ශාඛා අපවහන ජාලය සහ මනුබිල් පොම්ප මධ්‍යස්ථාන නිර්මාණය හා ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව 2019 ජුලි 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය නිසා 2019 දෙසැම්බර් 31 දිනෙන් පසුවත් කොන්ත්‍රාත්තුව කරගෙන ගොස් තිබුණු අතර ඒ සඳහා ව්‍යාපෘතියේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | දුර්වල ව්‍යාපෘති කළමනාකරණය ව්‍යාපෘති කාර්ය සාධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැක. | කළමනාකරණයේ අදහස් ලැබී නොමැත. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කොට කාල දිගුවට අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) ව්‍යාපෘතියේ කාර්යය අවසාන නොවුවද, 2020 වර්ෂයේ ණය ආපසු ගෙවීම් ආරම්භ කර තිබුණි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනය අනුව 2020 මාර්තු 31 දින වන විට ණය ආපසු ගෙවීම් ලෙස එකතුව රු.මිලියන 398.94 ක් සහ කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රමාද වීම, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යය සාධනය හා දුර්වල ව්‍යාපෘති කළමනාරණය හේතුවෙන් උපයෝජනය නොකළ ණය ශේෂය මත 2019 දෙසැම්බර් 31 දන දක්වා බැඳීම් ගාස්තු ලෙස රු. මිලියන 153.72 ක් ණය නියෝජිතායතනය විසින් අය කර තිබුණි. | රජයට අතිරේක පිරිවැය දැරීමට සිදු විය හැක. | කළමනාකරණයේ අදහස් ලැබී නොමැත. | ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘති කාර්යය සාධනය කඩිනම් කිරීම සඳහා ක්‍රියාමර්ග ගත යුතුය. |
| (ඇ) ඉදිකිරීම් කරන ලද දෙයියන්වෙල පොම්පාගාර සහිත ඉඩමේ සහ පොම්පාගාරයේ ඉදි කිරීම් කරමින් පවතින මහාමයා ප්‍රාථමික විද්‍යාලයට ආසන්න ඉඩමේ අයිතිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ගෙන නොතිබුණි. | ඉඩම්වල අයිතිය මාරු කිරීම ප්‍රමාද වීම ව්‍යාපෘති කාර්යය සඳහා අහිතකර ලෙස බල පෑ හැක. | කළමනාකරණයේ අදහස් ලැබී නොමැත. | තව දුරටත් ප්‍රමාදවීමකින් තොරව ඉඩම්වල අයිතිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා ගැනීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |

**3.3 පරිබාහිර ගනුදෙණු**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| ----------------- | ----------- | ------------------- | ----------------------- |
| ව්‍යාපෘතිය විසින් කලමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව විසින් අනුමත කරන ලද සේවක ලේඛනයේ නොමැති ව්‍යාපෘති සම්බන්ධීකරණය නිළධාරී තනතුර සඳහා පුද්ගලයෙක් බඳවා ගෙන තිබුණි. කෙසේ වුවද, අදාල නිළධාරියා කිසිදු ව්‍යාපෘති කාර්යයක් සඳහා සම්බන්ධ වී නොතිබුණු අතර නිළධාරියාගේ පැමිණිමේ වාර්තාද නඩත්තු කර නොතිබුණි. මේ සම්බන්ධව, ව්‍යාපෘතිය කාර්යාලය විසින් 2019 දෙසැම්බර් 31 දින විට වේතන ලෙස එකතුව රු.මිලියන 2.60ක් සහ පවරන ලද මෝටර් රථයේ ලීසිං ගාස්තු ලෙස රු.මිලියන 2.53ක් ගෙවා තිබුණි. | ව්‍යාපෘති පරිපාලන වියදම් අනවශ්‍ය ලෙස ඉහල යනු ඇත. | ප්‍රධාන කාර්යාලයේ මණ්ඩල තීරණයක් මඟින් ව්‍යාපෘති සම්බන්ධීකරණ නළධාරී පත් කරන ලදී. අමාත්‍යාංශය සඳහා සම්බන්ධීකරණ නිලධාරීයා අනුයුක්ත කර තිබූ නිසා ව්‍යාපෘතිය විසින් පැමිණීමේ ලේඛන නඩත්තු නොකරණ ලදී. | අනුමත ව්‍යාපෘති කාර්යය මණ්ඩලයට පමණක් වැටුප් ගෙවිය යුතුය. |

### 3.4 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණ<br>----------------------- | බලපෑම<br>----------- | කළමනාකරණයේ අදහස් දැක්වීම<br>------------------------- | විගණකගේ නිර්දේශ<br>------------------- |
| --- | --- | --- | --- |
| (අ) 2016 ජුනි 10 දිනැති කලමනාකරණ විගණන චක්‍ර ලේඛ අංක 02/2016 පරිදි අභ්‍යන්තර විගණනකවරයෙක් බඳවා සේවයේ යෙදවීමට හෝ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ ගනුදෙනු අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතියේ මූල්‍ය හා ක්‍රියාකාරී කටයුතුවල දුර්වල පාලනය ව්‍යාපෘති කාර්ය සාධනය කෙරෙහි අහිතකර ලෙස බල පෑ හැක. | කළමනාකරණයේ අදහස් ලැබී නොමැත. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට ක්‍රියා කළ යුතුය. |